# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1968/10 - 2016 මැයි මස 25 වැනි බදාදා - 2016.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත**

ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් ඃ නියමුවන් රහිත ගුවන් යානා
(මිනිසුන් රහිත ගුවන්ගත වාහන/දුරස්ථ පාලක ගුවන් යානා)
මෙහෙයුම් කිරීම සඳහා වන අවශ්‍යතා

සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් එච්. එම්. සී. නිමල්සිරි වන මම, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 120 (1) වගන්තිය ප්‍රකාරව මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් මේ සමඟ නිකුත් කරමි.

එච්. එම්. සී. නිමල්සිරි,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්,
සහ ප්‍රධාන විධායක නිලධාරී.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
අංක 64, ගාලු පාර,
කොළඹ 03.

**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය**

***ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති***

(2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 120 වගන්තිය යටතේ නිකුත් කරන ලදී)

*මාතෘකාව ඃ නියමුවන් රහිත ගුවන් යානා (මිනිසුන් රහිත ගුවන්ගත වාහන/දුරස්ථ පාලක ගුවන් යානා)*
*මෙහෙයුම් කිරීම සඳහා වන අවශ්‍යතා*

**යොමු අංක ඃ** CA-IS-2015-GEN-001 **ශ්‍රී.ල.සි.ගු.සේ.ක්‍රි.ප්‍ර. ඃ** 053 **දිනය ඃ** 2015 පෙබරවාරි 25

මෙහි මින්මතු සිවිල් ගුවන් සේවා පනත යනුවෙන් යොමු කරනු ලබන 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 120 වගන්තිය ප්‍රකාර, සිවිල් ගුවන් සේවා පනතේ උපලේඛනයෙහි නියමිත ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සම්මුතියෙහි ව්‍යවස්ථා ද ඇතුළුව සිවිල් ගුවන් සේවා පනතෙහි විධිවිධාන කිසිවක් හෝ එකී පනත යටතේ පනවන ලද රෙගුලාසි හෝ රීති කිසිවක් හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති කිසිවක් නිකුත් කිරීම අවශ්‍ය වන බව හෝ සුදුසු වන හෝ අදහස් කරන අවස්ථාවක එවැනි ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති කිසිවක් නිකුත් කිරීමේ බලය සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සතුව පවතී.


1A - G 23512 — 27 (2016/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මේ අනුව, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් වන මම, මේ සමග ඇති ඇමුණුමෙහි (යොමු අංක : CA-IS-2016-GEN-001 - ඇමුණුම - 01) සඳහන් ''නියමුවන් රහිත ගුවන් යානා'' (මිනිසුන් රහිත ගුවන්ගත වාහන/දුරස්ථ පාලක ගුවන් යානා) මෙහෙයුම් කිරීම සඳහා වන අවශ්‍යතා යන හිසින් යුත්, සිවිල් ගුවන් සේවා පනතේ 80 වන වගන්තිය යටතේ හෝ එහි උපලේඛනයෙහි 8 වන වගන්තිය යටතේ හෝ සම්මුතියෙහි 2 ඇමුණුමෙහි 4 පරිශිෂ්ඨයෙහි නියමිත අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් යටතේ හෝ නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් සිදු කිරීමේ දී පිළිපැදිය යුතු ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති මෙයින් නිකුත් කරමි.

ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියක් අනුව කටයුතු කිරීම පැහැර හැරීම වරදක් බව සඳහන් කෙරෙන, සිවිල් ගුවන් සේවා පනතේ 103 වගන්තිය කෙරෙහි ද මෙහි දී අවධානය යොමු කරවනු ලැබේ.

එච්. එම්. සී. නිමල්සිරි,<br>
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්,<br>
සහ ප්‍රධාන විධායක නිලධාරී.

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,<br>
අංක 04, හුණුපිටිය පාර,<br>
කොළඹ 02.

ඇමුණුම අංක. CA-IS-2016-GEN-001 - ඇමුණුම - 01

## ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති අංක SLCAIS - 053

නියමුවන් රහිත ගුවන් යානා (මිනිසුන් රහිත ගුවන්ගත වාහන/දුරස්ථ පාලක ගුවන් යානා) මෙහෙයුම් කිරීම සඳහා වන අවශ්‍යතා

*1. අදාළත්වය*

මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි නියම කරන ලද අවශ්‍යතා, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 80 වන වගන්තිය සහ එහි උපලේඛනයෙහි 8 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකාවේ ගුවන් අවකාශය ඇතුළත මෙහි මින්මතු **නියමුවන් රහිත ගුවන් යානා** වශයෙන් සාමූහිකව හඳුන්වනු ලබන දුරස්ථ පාලක ගුවන් යානා, පාලන නූල් සහිත ආදර්ශ ගුවන් යානා, ස්වයං පියසර ආදර්ශ ගුවන් යාන හෝ ඩ්‍රෝන හෝ මෙහෙයුම් කිරීම සම්බන්ධව අදාළ විය යුතු ය.

*2. අනුමත පුද්ගලයා හෝ සංවිධානය*

(අ) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සඳහා සහ ඔහු වෙනුවෙන් පහත සඳහන් කාර්යයන් එකක් හෝ වැඩි ගණනක් හෝ ඉටුකිරීම සඳහා, නියමුවන් රහිත ගුවන් යාන සැළසුම් කිරීම, තැනීම හෝ මෙහෙයුම් කිරීම පිළිබඳ උචිත විශේෂඥ භාවය සහිත හෝ ගුවන් අවකාශ විස්තර සහ සීමා කිරීම් පිළිබඳ ප්‍රමාණවත් දැනුම සහිත හෝ පුද්ගලයෙකු හෝ සංවිධානයක් හෝ අවස්ථාවට ගැලපෙන පරිදි, මෙහි මින්මතු සඳහන් කර ඇති අනුමත පුද්ගලයෙකු හෝ අනුමත සංවිධානයක් වශයෙන් අනුමත කිරීමට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ට පිළිවන.

(i) නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් කිරීම සඳහා නියමු යෝග්‍යතාවක් නිකුත් කිරීම හෝ

(ii) නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම්කරුවන්ට උපදෙස්දීම සඳහා පුද්ගලයින් පත්කිරීම හෝ

(iii) නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් සම්බන්ධව නෝටැමයක් නිකුත් කිරීම සඳහා ගගන නාවික තොරතුරු සේවා සැපයුම්කරු වෙත අවශ්‍ය තොරතුරු දැනුම් දීම සඳහා පුද්ගලයෙකුට බලය පැවරීම හෝ

(iv) නියමුවන් රහිත ගුවන් යානා තැනීම හෝ වෙනස් කිරීම සඳහා බලය පැවරීම හෝ

(v) නියමුවන් රහිත ගුවන් යානාවක් තැනීම පරීක්ෂා කිරීම සහ අනුමත කිරීම හෝ

(vi) දුරස්ථ පාලක ගුවන් යානයක් මෙහෙයුම් කිරීම සඳහා බලය පැවරීම

(ආ) ඉහත විධිවිධාන කිසිවක් නොසලකා, නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් කිරීම සඳහා අනුමැතිය ඉල්ලමින් ඔහු වෙත කෙලින්ම අයදුම්පතක් ඉදිරිපත් කරන පුද්ගලයෙකුට හෝ සංවිධානයකට හෝ ඒ සඳහා අනුමැතිය දීමට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ට පිළිවන.

ඇමුණුම අංක : - CA-IS-2016-GEN-001 - ඇමුණුම - 1

(ඇ) මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි කාර්‍යයන් සඳහා අනුමත පුද්ගලයෙකුගේ හෝ අනුමත සංවිධානයක හෝ තත්ත්වය ලබා ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයෙකුට හෝ සංවිධානයකට හෝ, ඒ සඳහා නියමුවන් රහිත ගුවන් යානා තැනීම/මෙහෙයුම/නඩත්තුව පිළිබඳව ඔහුට/ඇයට ඇති සුදුසුකම් සහ පළපුරුද්ද සඳහන් කරමින් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය.

*3. නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් කිරීම සඳහා වන ස්කන්ධ සීමා*

(අ) පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්නම් විනා දළ ස්කන්ධය කි. ග්‍රෑම් 25 ට වැඩි නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් නොකළ යුතු ය.

(a) ඒ සඳහා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නිශ්චිත අනුමැතිය ලබාගෙන තිබීම.

(b) ගුවන් යානා පැදවීමට අදාළව පළකරනු ලැබ ඇති පුද්ගල බලපත්‍ර, ගුවන් යානා මෙහෙයුම් සහ ගුවන් යෝග්‍යතාව සම්බන්ධ අවශ්‍යතා සියල්ල සම්පූර්ණ කර තිබීම.

(ආ) මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි නියමිත අවශ්‍යතා සමඟ අනුවෘත්‍යය පැවැත්වීමට යටත්ව කි. ග්‍රෑ. 01 සහ කි. ග්‍රෑම් 25 අතර ස්කන්ධයකින් යුත් නියමුන් රහිත ගුවන් යානයක් -

(a) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ, අනුමත පුද්ගලයෙකුගේ හෝ අනුමත සංවිධානයක හෝ අධිකාරි බලය යටතේ සැලසුම් කිරීම, නිර්මාණය කිරීම හෝ නඩත්තු කිරීම කළ හැකිය, එමෙන්ම.

(b) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ, අනුමත පුද්ගලයෙකුගේ හෝ අනුමත සංවිධානයක හෝ අධිකාරි බලය යටතේ මෙහෙයුම් කිරීම ද සිදු කළ හැකි ය.

(ඇ) කි. ග්‍රෑ. 01 ට අඩු ස්කන්ධය සහිත නියමුවන් රහිත ගුවන් යානයක් අදාළ දේපල හිමිකරුගේ අනුමැතිය සහිතව පෞද්ගලික භූමියක හෝ ඒ සඳහා පැහැදිළිව හඳුනාගත් පොදු ස්ථානයන් හි හෝ පුද්ගලයින්ගේ සහ දේපළවල නිරුපද්‍රතතාව කෙරෙහි නිසි අවධානය සහිතව විනෝද හෝ අධ්‍යාපන කාර්‍යයන් සඳහා මෙහෙයුම් කරන්නේ නම් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය රහිතව එසේ මෙහෙයුම් කළ හැකි ය.

*4. පියාසර කිරීමට අවසර ලබාදීම*

පහත සඳහන් අවස්ථාවන්හි හැර, මෙහි 2 (අ) සහ 2 (ආ) ඡේදයන් හි සඳහන් ස්කන්ධ ප්‍රවර්ගයේ නියමුවන් රහිත ගුවන් යානයක්, එම ගුවන් යානය මෙහෙයුම් කරන ප්‍රදේශය භාර ප්‍රාදේශීය පොලීසියෙන් ලබාගත් පියසර අවසරයක් රහිතව කිසිදු ප්‍රදේශයකට ඉහළින් විවෘත අහසේ මෙහෙයුම් නොකළ යුතු ය.

(අ) නියමුවන් රහිත ගුවන් යානයක් අනුමත කරන ලද ගගන යාත්‍රාංගනයක් තුළ මෙහෙයුම් කිරීම.

(ආ) නියමුවන් රහිත ගුවන් යානයක් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් බලය පවරන ලද පුද්ගලයෙකු ඉදිරියේ මෙහෙයුම් කිරීම.

(ඇ) නියමුවන් රහිත ගුවන් යානයක් එම ගුවන් යානය හිමිකරුට අයිති භූමිය තුළම, කිසිසේත්ම ඉන් පිටතට නොයවා මෙහෙයුම් කිරීම.

*5. හඳුනා ගැනීමේ මුද්‍රාව*

(අ) මෙහි 2 (අ) සහ 2 (ආ) ඡේද යටතේ සඳහන් ස්කන්ධ ප්‍රවර්ගයේ නියමුවන් රහිත ගුවන් යානයක්, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් හෝ ඔහු විසින් නිසි පරිදි බලය පවරනු ලැබූ පුද්ගලයෙකු විසින් හෝ සංවිධානයක් විසින් හෝ නිකුත් කරන ලද හඳුනා ගැනීමේ මුද්‍රාවක් රහිතව ශ්‍රී ලංකාවේ කිසිදු ප්‍රදේශයක මෙහෙයුම් නොකළ යුතු ය.

(ආ) නියමුවන් රහිත ගුවන් යානයක ප්‍රදර්ශනය කෙරෙන හඳුනාගැනීමේ මුද්‍රාවක, එහි හඳුනා ගැනීමේ අංකය, එය අයිතිකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ ඔහු හෝ ඇය සම්බන්ධකර ගත හැකි ආකාරය පිළිබඳ විස්තර සඳහන් විය යුතු ය.

*6. වාණිජ කාර්‍යයන් සඳහා නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් කිරීම*

නියමිත ගාස්තුව ගෙවා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් එකිනෙක අවස්ථාව සඳහා වෙන වෙනම ලබාගත යුතු විශෙෂ ලිඛිත අනුමැතියක් ලබාගෙන විනා කිසිදු ස්කන්ධ ප්‍රවර්ගයකට අයත් නියමුවන් රහිත ගුවන් යානයක් කුලියක් හෝ ප්‍රතිලාභයක් හෝ ලබාගැනීම සඳහා මෙහෙයුම් නොකළ යුතු ය.

*7. ගුවන් ගත කාර්‍යයන් සඳහා නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් කිරීම*

නියමිත ගාස්තුව ගෙවා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ලබාගත යුතු විශේෂ ලිඛිත අනුමැතියක් ලබාගෙන විනා කිසිදු ස්කන්ධ ප්‍රවර්ගයකට අයත් නියමුවන් රහිත ගුවන් යානයක් කිසිදු ගුවන්ගත කාර්‍යයක් සඳහා මෙහෙයුම් නොකළ යුතු ය.

*8. පාලන නූල සහිත ආදර්ශ ගුවන් යානා*

පාලන නූල සහිත ආදර්ශ ගුවන් යානයක් මීටර් 30 කට වැඩි දිග එක් නූලක් හෝ නූල් වැඩි ගණනක් සහිත පද්ධතියකින් සමන්විත නම් මෙහෙයුම් නොකළ යුතු ය.

*9. දුරස්ථ පාලක ගුවන් යානා නිරුපද්‍රතව මෙහෙයුම් කිරීම*

පුද්ගලයින් හෝ දේපළ අනතුරට පත් නොකර නිරුපද්‍රතව මෙහෙයුම් සහතික කිරීම සඳහා පියසරයට පූර්වයෙහි සාමාන්‍ය මෙහෙයුම් සඳහා ගුවන් යානයෙහි ප්‍රේරක ක්‍රමය බල ප්‍රභවය සහ පාලන උපක්‍රමික පිරික්සීමෙන් සහ හරි වැරදි බැලීමෙන් පසුව විනා කිසිදු ස්කන්ධ ප්‍රවර්ගයකට අයත් නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් නොකළ යුතු ය.

*10. නියමුවන් රහිත ගුවන් යානයක මෙහෙයුම්කරුගේ තත්ත්වය*

කිසියම් පුද්ගලයෙකු,

(අ) ගුවන් යානය නිරුපද්‍රිතව මෙහෙයවීම සහ හැසිරවීම පිළිබඳ සමීප දැනුමක් ඔහු සතුව නොමැති නම්

(ආ) යහපත් කායික හා මානසික සෞඛ්‍ය තත්ත්වයක පසු නොවන්නේ නම් සහ

(ඇ) මද්‍යසාර හෝ මත්ද්‍රව්‍ය (මනෝ ක්‍රියාකාරී ද්‍රව්‍ය) පාවිච්චි කර එයින් මත්වී සිටින්නේ නම් සහ

(ඈ) සමාජ වගකීම පිළිබඳ ස්ථිර හැඟීමක් නොමැත්තේ නම් ඔහු/ඇය නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් නොකළ යුතු ය.

*11. මෙහෙයුම් කිරීමේ ස්ථාන*

(අ) ඒ ඒ ඉදිරියෙන් සඳහන් ආකාරයට මෙහෙයුම් කරන්නේ නම් විනා පහත සඳහන් ගඟන යාත්‍රාංගනයන් හි මායිමේ සිට සැතපුම් පහක් (05) මත හෝ ඉන් ඇතුළත හෝ නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් නොකළ යුතු ය.

(a) ගමන් පාලනය රහිත ගගන යාත්‍රාංගනයක

1. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් අනුමැතිය සහිතව සහ ගගන යාත්‍රාංගන මෙහෙයුම්කරු සමඟ ඇතිකර ගන්නා ගිවිසුමකට අනුව මෙහෙයුම සිදු කරන්නේ නම් විනා සහ

2. නිදහස් පියසර ආදර්ශ ගුවන් යානයක් සම්බන්ධයෙන් වූ කලී සක්‍රීය ධාවන පථයක සුළං පහලට (downwind) ගුවන් යානය දියත් කරන්නේ නම් විනා සහ

3. දුරස්ථ පාලක ගුවන් යානයක් සම්බන්ධයෙන් වූ කලී

i. ගුවන් යානය පියසරයෙහි යෙදෙන අතරතුර එක් එක් නියමුවා සමඟ නිරීක්ෂකයෙකු බැගින් සිටින්නේ නම් සහ

ii. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අන්‍යාකාරයෙන් අනුමත කර ඇත්නම් විනා භූමි මට්ටමේ සිට අඩි 400 කට වැඩි උසකින් ගුවන් යානය මෙහෙයුම් නොකරන්නේ නම් විනා සහ

(b) ගුවන් ගමන් පාලනය සහිත ගගන යාත්‍රාංගනයක අදාළ ගුවන් ගමන් පාලන ඒකකයෙන් සහ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ලබාගත් බලය පැවරුමකට අනුව අදාළ ගුවන් යානය මෙහෙයුම් කරන්නේ නම් විනා සහ

(c) ඕනෑම ගගන යාත්‍රාංගනයක - මෙහෙයුම් කරන පුද්ගලයා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඒ සඳහා පූර්ව අනුමැතිය ලබාගෙන ඇත්නම් විනා සහ

1. එම පුද්ගලයා අනුමත පුද්ගලයෙකු විසින් හෝ අනුමාන සංවිධානයක් විසින් හෝ නිකුත් කරන ලද නියමු යෝග්‍යතාවයක් දරන්නකු වන්නේ නම් හෝ එවැනි නියමු යෝග්‍යතාවක් දරන්නෙකුගේ ඍජු අධීක්ෂණය යටතේ කටයුතු කරන්නේ නම් හෝ

ඇමුණුම අංක ෑ - CA-IS-2016-GEN-001 - ඇමුණුම - 1

2. ඔහු අනුමත පුද්ගලයෙකු විසින් හෝ අනුමත සංවිධානයක් විසින් හෝ දුරස්ථ පාලක ගුවන් යානා මෙහෙයුම පිළිබඳව උපදෙස් දීම සඳහා පත්කරනු ලැබ ඇති පුද්ගලයෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ කටයුතු කරන්නේ නම් හෝ

3. ඔහු සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද ගුවන් නියමු බලපත්‍රයක් හෝ සහතිකයක් හෝ දරන්නකු වන්නේ නම් විනා

(ආ) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අන්‍යාකාරයෙන් ලිඛිතව බලය පවරනු ලැබ ඇත්නම් විනා ශ්‍රී ලංකාවේ කිසිදු ප්‍රදේශයක මෙහි පහත සඳහන් ස්ථානයන් හි නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් නොකළ යුතු ය.

(*a*) ගගන යාත්‍රාංගනයක චලන ප්‍රදේශය මත හෝ ඊට ඉහළින් හෝ

(*b*) කිසියම් සක්‍රීය ධාවන පථ තීරුවක් සහිත ප්‍රදේශයක් මත හෝ ඊට ඉහළින් හෝ

(*c*) පුද්ගලයින් රැස්වූ ස්ථානයකට හෝ ප්‍රසිද්ධ රැස්වීම්වලට හෝ ඉහළින් හෝ

(*d*) ජනාකීර්ණ ප්‍රදේශවලට ඉහළින් හෝ

(*e*) මහා මාර්ගයක් හෝ දුම්රිය මාර්ගයක් දිගේ හෝ ඊට ඉහළින් හෝ

(*f*) විවෘත විදුලිය රැහැන් මාර්ගයකට ඉහළින් හෝ පහළින් හෝ

(*g*) සංදේශන කුළුණු කිසිවකට නුදුරින් හෝ

(*h*) අනුමැතිය රහිතව ජාතික වනෝද්‍යානයක, ආරක්ෂිත ප්‍රදේශ තුළ හෝ ආරක්ෂක ආයතනයන් හි

(ඇ) පහත සිදු කරනු ලබන ආවරණය කළ මෙහෙයුමකට 10 (අ) ඡේදය අදාළ නොවන්නේ ය.

(*a*) ගගන යාත්‍රාංගනයක මායිමෙන් පිටත සහ

(*b*) ගුවන් යානයේ පියසරය නැවැත්වීමේ හැකියාව සහිත බාධකයකින් භෞතික වශයෙන් ගගන යාත්‍රාංගනයෙන් වෙන් වී ඇති ගුවන් අවකාශයෙහි

(ඈ) අදාළ ගුවන් යානය අඩි 100 කට වැඩි උසකින් පියාසර නොකර වන්නේ නම් මෙහි ඉහත 10 (අ) සහ (ඇ) ඡේදය ස්වාධීන පියසර ආදර්ශ ගුවන් යානයක් සම්බන්ධයෙන් අදාළ නොවන්නේ ය.

***12. ගුවන් අවකාශය***

(*අ*) නියමුවන් රහිත ගුවන් යානයක්

(*a*) කිසියම් දේපලක පදිංචි වී සිටින පුද්ගලයින්ගෙන් හෝ එම දේපල හිමිකරුගේ හෝ ප්‍රකාශිත පූර්ව අනුදැනුම ලබාගෙන ඇත්නම් විනා එම දේපළට ඉහළින් සහ

(*b*) තුන්වන පාර්ශ්වයකට හෝ දේපළකට හෝ නිරුපද්‍රිතතා හෝ සුරක්ෂිතතා උපද්‍රවයක් සිදුවන පරිදි සහ

(*c*) අනෙක් ගුවන් යානා සඳහා ගුවන් යානය මෙහෙයවන ගුවන් අවකාශය සම්බන්ධ නිරීක්ෂණයක් පවත්වා නොගනිමින් සහ

(*d*) 11 (ඈ) ඡේදයට අනුකූලව හැර භූමි මට්ටමේ සිට අඩි 400 කට වැඩි කිසිදු උසකින් මෙහෙයුම් නොකළ යුතු ය.

(*ආ*) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ හෝ අනුමත සංවිධානයක හෝ අධිකාරි බලය යටතේ ගුවන් යානය මෙහෙයුම් කරන්නේ නම් 10 (අ) (a) ඡේදයේ සඳහන් විධිවිධාන කිසිවක් ඊට අදාළ නොවන්නේ ය.

(*ඇ*) පහත සඳහන් පරිදි මෙහෙයුම් කරන්නේ නම් නියමුවන් රහිත ගුවන් යානයක් ගගන යාත්‍රාංගනයක මායිමේ සිට සැතපුම් 5 කට වැඩි දුරක සහ භූමි මට්ටමේ සිට අඩි 400 කට වැඩි උසක මෙහෙයුම් කළ හැකි ය.

(*a*) එම කාර්‍ය්‍ය සඳහා නම් කරනු ලැබ ඇති සක්‍රීය අනතුරු ප්‍රදේශයක මෙහෙයුම් සිදු කරන්නේ නම් හෝ

(*b*) අදාළ මෙහෙයුම C,D සහ E පංතියේ ගුවන් අවකාශයෙන් සම්පූර්ණයෙන් බැහැරව සිදු කරන්නේ නම් සහ අවම වශයෙන් මෙහෙයුමට පැය 24 කට පෙර අනුමත පුද්ගලයෙකු විසින් හෝ අනුමත සංවිධානයක් විසින් හෝ බලය පවරන ලද පුද්ගලයෙකු නෝටැමයක් (NOTAM) නිකුත් කිරීම සඳහා පහත සඳහන් තොරතුරු ගගන නාවික තොරතුරු සේවා සැපයුම්කරු වෙත දැනුම් දෙන්නේ නම් ;

1. මෙහෙයුම්කරුගේ නම, ලිපිනය සහ දුරකථන අංකය
2. යෝජිත මෙහෙයුම සිදු කරන ස්ථානය
3. යෝජිත මෙහෙයුමේ දිනය, වේලාව සහ පවතින කාලය
4. ගුවන් යානා මෙහෙයුම සඳහා යෝජිත, භූමි මට්ටමේ සිට උපරිම උස

*13. මාර්ග අයිතිය*

(*අ*) නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් කරන පුද්ගලයකු තමන් මෙහෙයුම් කරන ගුවන් යානය සෑම විටම භූමිය මත තිබෙන සහ පියසරෙහි යෙදෙන සියළුම මිනිසුන් සහිත ගුවන් යානාවලට මාර්ගය ලබාදෙන බවටත් එකී ගුවන්යානාවලින් දුරස්ව පිහිටන බවටත් සහතික විය යුතු ය.

(*ආ*) නිදහස් පියසර ආදර්ශ ගුවන් යානයක් මෙහෙයුම් කරන පුද්ගලයෙකු ගුවන් යානය දියත් කිරීමට පෙර, අපේක්ෂිත මෙහෙයුම අතර තුරදී එම ගුවන් යානය සෑම විටම භූමිය මත තිබෙන සහ පියසරයේ යෙදෙන සියළුම මිනිසුන් සහිත ගුවන් යානා වලින් දුරස්ථව පවතින බවට සහතික විය යුතු ය.

(*ඇ*) නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් කරන පුද්ගලයෙකු තමන් මෙහෙයුම් කරන ගුවන් යානය පොළව මත හෝ දිය මත හෝ ඇති සියළුම චලනය වන වස්තූන්ට මාර්ගය ලබාදී දුරස්ථව පවතින බවට සහතික විය යුතු ය.

(*ඈ*) නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් කරන පුද්ගලයෙකු තමන් මෙහෙයුම් කරන ගුවන් යානය පුද්ගලයින්ගෙන්, සත්ත්වයින්ගෙන්, පක්ෂීන්ගෙන් සහ දේපළ වලින් හොඳින් දුරස්ථව පවතින බවට සහතික විය යුතු ය.

*14. වස්තූන් පතිත කිරීම සහ පතාක (බැනර) ප්‍රදර්ශනය කිරීම*

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ලබාගත් අනුමැතියක් රහිතව, පියසරයේ යෙදෙන නියමුවන් රහිත ගුවන් යානයකින් කිසිදු වස්තුවක් බිමට පතිත කිරීම හෝ එම ගුවන් යානයේ කිසිදු පතාකයක් ප්‍රදර්ශනය කිරීම හෝ සිදු නොකළ යුතු ය.

*15. ඇදගෙන යාම*

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ලබාගත් නිශ්චිත අනුමැතියක් රහිතව නියමුවන් රහිත ගුවන් යානයකින් කිසිවක් ඇදගෙන යාම (Towing) සිදු නොකළ යුතු ය.

*16. දෘෂ්ඨි රේඛා දෘශ්‍යමාන මෙහෙයුම*

(*අ*) පහත දැක්වෙන ස්ථානයන්හි දී සහ තත්ත්වයන්හි දී නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් කිරීම සිදු නොකළ යුතු ය.

- (*a*) ගුවන් යානය මෙහෙයුම් කරන අවට අවකාශය මෙහෙයුම් කරන පුද්ගලයාට නොපෙනෙන පරිදි එහි දර්ශනය අවහිර වී ඇති කිසියම් ප්‍රදේශයකට ඉහළින්
- (*b*) ඉහළට ඔසවන ලද කිසියම් භූමියක, ගොඩනැගිල්ලක හෝ වස්තුවක සිට
- (*c*) ගුවන් යානයේ දෘෂ්‍යමාන දෘෂ්ඨි රේඛාව නොකඩවා පවත්වාගෙන මෙහෙයුම් කරන පුද්ගලයාට ඇති හැකියාව අවහිර කරන කාලගුණ විද්‍යාත්මක තත්ත්වයන්හි දී

(*ආ*) නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් කරන පුද්ගලයෙකු සෑම විටම -

- (*a*) ගුවන් යානය සමඟ දෘෂ්‍යමාන දෘෂ්ඨි රේඛාව පවත්වාගෙන යා යුතු ය.
- (*b*) ඔහුට ගුවන් යානය මෙහෙයුම් කරන අවම ගුවන් අවකාශය දැකීමේ හැකියාව තිබිය යුතු ය.
- (*c*) ගුවන් යානය වලාකුළු පතුලට පහලින් රඳවා ගත යුතු ය.

(*ඇ*) මෙම ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි කාර්යයන් සඳහා දෘශ්‍යමාන දෘෂ්ඨි රේඛාව යනුවෙන් අදහස් කරනුයේ නිරීක්ෂකයෙකුට එම රේඛාව ඔස්සේ පැහැදිළි දර්ශනයක් ලැබිය හැකි ඍජු රේඛාවක් වන අතර මෙකී දෘෂ්ඨි රේඛාව පහත සඳහන් ආධාරක පාවිච්චි කිරීමෙන් ද ලබාගත හැකි ය.

(*a*) විද්‍යුත්, යාන්ත්‍රික, විද්‍යුත්චුම්බක, දෘෂ්ඨීය හෝ විද්‍යුත් දෘෂ්ඨිමය උපකරණයක් හැර ඇස් කණ්ණාඩි, ස්පර්ශක කාච හෝ පාවිච්චි කරන්නාගේ උප ප්‍රකෘති පෙනීම ප්‍රකෘති පෙනීමට වැඩි නොවන ප්‍රමාණයක් දක්වා නිවරද කිරීම සඳහා පාවිච්චි කරනු ලබන ඒ හා සමාන උපක්‍රමිකයක් හෝ

(*b*) ප්‍රථම පුද්ගල දර්ශන ක්‍රමයක් සහ පවත්වාගෙන යන පුහුණු කරන ලද සහ හැකියාව සහිත නිරීක්ෂකයෙකු

- (i) ගුවන් යානයේ දෘශ්‍යමාන දෘෂ්ඨි රේඛාව සහ
- (ii) ගුවන් යානය මෙහෙයුම් කරනු ලබන අවට ගුවන් අවකාශයෙහි දර්ශනය සහ
- (iii) ගුවන් යානය මෙහෙයුම් කරන පුද්ගලයා සමඟ ඍජු සන්නිවේදනයක්

*17. රාත්‍රී මෙහෙයුම්*

පහත සඳහන් පරිදි සිදු කරනු ලබන මෙහෙයුමක් හැර අඳුරු වැටුණු අවස්ථාවේ සිට අරුණෝදය දක්වා වූ කාලය (රාත්‍රිය) තුළ නියමුවන් රහිත ගුවන් යානයක් මෙහෙයුම් නොකළ යුතු ය.

(අ) ප්‍රමාණවත් ආලෝකයක් සහිතව සිදු කරනු ලබන ගෘහස්ථ මෙහෙයුමක්

(ආ) ප්‍රමාණවත් ප්‍රදීපනයක් සහිතව සිදු කරනු ලබන ආවරණය කළ මෙහෙයුමක්

*18. ගුවන් තරග*

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ලබාගත් විශේෂ අනුමැතියක් රහිතව නියමුවන් රහිත ගුවන් යානයක් ධාවන තරගයක හෝ වෙනත් කිසිදු ආකාරයක තරගයක හෝ මෙහෙයුම් නොකළ යුතු ය.

*19. වෙනස් කිරීම්*

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්ගෙන්, දැනටමත් අනුමැතිය ලැබී ඇති නියමුවන් රහිත ගුවන් යානයක්, අනුමත පුද්ගලයෙකුගෙන් හෝ අනුමත සංවිධානයකින් හෝ වෙනස් කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය රහිතව එසේ වෙනස් නොකළ යුතු ය.

*20. ගුවන් විදුලි නිරෝධනය*

නියමුවන් රහිත ගුවන් යානයක් ගුවන් විදුලි සන්නිවේදනයට, ගුවන් යානා සංතරණයට හෝ සෝදිසියට සහ/හෝ ගුවන් ගමන් කළමනාකරණ පද්ධතියට බාධා පැමිණෙන සේ මෙහෙයුම් නොකළ යුතු ය.

06 - 242

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.